| | |
|---|---|
| | මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය |
| | දෙවන වාර ඇගයීම - 2025 |
| 8 ශ්‍රේණිය | බුද්ධ ධර්මය |

නම/ විභාග අංකය: ........................................ කාලය : පැය 2 යි

## I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1) ධර්ම රත්නයේ ගුණ ගණන වන්නේ,
   i. 8 කි
   ii. 6 කි
   iii. 24 කි
   iv. 243 කි

2) තමාට මෙලොවදීම දැන දැකගත හැකි බැවින් ධර්මය,
   i. අකාලික වේ
   ii. ස්වාක්ඛාත වේ
   iii. සන්දිට්ඨික වේ
   iv. ඒහිපස්සික වේ

3) දානමය පිංකමක දානයේ ආනිශංස පැහැදිලි කරමින් සිදුකරන ධර්ම දේශනාව,
   i. භුක්තානුමෝදනාවයි
   ii. පිරිකර දේශනාවයි
   iii. පින් අනුමෝදනාවයි
   iv. පැන් වැඩීමයි

4) බුදු ගුණ මෙනෙහි කරමින් සිදුකරන භාවනාව වන්නේ,
   i. ආනාපානසති භාවනාවයි
   ii. මෛත්‍රී භාවනාවයි
   iii. බුද්ධානුස්සති භාවනාවයි
   iv. ධම්මානුස්සති භාවනාවයි

5) බුදුරජාණන් වහන්සේ සිගාලෝවාද සූත්‍රය දේශනා කළේ,
   i. ආනන්ද හිමිහට
   ii. සිගාල ගෘහපතියා හට
   iii. නන්ද හිමි හට
   iv. කාශ්‍යප හිමි හට

6) මිතුරාගෙන් තම මිතුරාට ඉටුවිය යුතු යුතුකමක් නොවන්නේ,
   i. පමාවූ මිතුරා රැක ගැනීම
   ii. පමාවූ මිතුරාගේ ධනය රැක ගැනීම
   iii. බිය පැමිණි විට මිතුරාට පිහිට වීම
   iv. ආපදාවන්හි හැර යාම

7) "සම්බුද්ධ ශාසනයේ අඩක් පමණ පවතින්නේ කල්‍යාණ මිත්‍ර ආශ්‍රය නිසා නේද?" යනුවෙන් බුදුරදුන්ගෙන් විමසා සිටියේ,
   i. නන්ද හිමි
   ii. ආනන්ද හිමි
   iii. කාශ්‍යප හිමි
   iv. සැරියුත් හිමි

8) බාලිකාවන් ලවා ජයමංගල ගාථා ගායනය කිරීම සිරිතක් ලෙස කරනුයේ,
   i. ගෘහ ප්‍රවේශ මංගල්‍යයකදී ය
   ii. පිරිත් පිංකමකදී ය
   iii. සරණ මංගල්‍යයකදී ය
   iv. උපන්දින උත්සවයකදී ය

9) ආහාර ගන්නා විට අප නොකළ යුතු දෙයක් වන්නේ,
   i. තලු නොගැසීම
   ii. දිව එළියට දැමීම
   iii. අතලෙව නොකෑම
   iv. සුරු සුරු ශබ්ද නොනැගීම

10) සිගාලෝවාද සූත්‍රයට අනුව මිතුරන් දක්වා ඇති දිශාව වන්නේ,

i. උතුරු දිශාව
ii. දකුණු දිශාව
iii. නැගෙනහිර දිශාව
iv. බටහිර දිශාව

11) බුදුරජාණන් වහන්සේ සමග වාද කිරීමට පැමිණ පසුව බුදුරදුන් පිළිබඳ පැහැදී අවසානයේ බෞද්ධ ශ්‍රාවකයෙකු බවට පත්වූයේ,

i. ආනන්ද හිමි
ii. නන්ද හිමි
iii. උපාලි ගෘහපති
iv. සිගාල ගෘහපති

12) ආයුශත් කර්ම ශක්තියත් යන දෙකම අවසන් වීමෙන් මරණය සිදුවීම හැඳින්වෙන්නේ,

i. අයුක්ඛය ලෙසය
ii. කම්මක්ඛය ලෙසය
iii. උභයක්ඛය ලෙසය
iv. උපච්ඡේදනය ලෙසය

13) සිතෙහි ප්‍රකෘති ස්වභාවය වෙනස්වන මදයට හා ප්‍රමාදයට හේතුවන අකුසලින් වෙන්වීමේ සිල්පදය වන්නේ,

i. සුරාමේරයෙන් වෙන්වීමේ සිල්පදය
ii. ප්‍රාණඝාතයෙන් වෙන්වීමේ සිල්පදය
iii. අදත්තාදානයෙන් වෙන්වීමේ සිල්පදය
iv. මුසාවාදයෙන් වෙන්වීමේ සිල්පදය

14) තුන් දොරට අයත් වේ,

i. සීලය
ii. කරුණාව
iii. කය
iv. මෙත්තාව

15) කයින් සිදුවන අකුසල කර්ම ගණයට අයත් වන්නේ,

i. බොරු කීම
ii. කේලම් කීම
iii. ව්‍යාපාදය
iv. සතුන් මැරීම

16) කරන කලට පව් මිහිරිය මීසේ ……………………… යන කවිය ඇතුළත් වන්නේ,

i. කාව්‍යශේඛරයේ ය
ii. ලෝවැඩ සඟරාවේ ය
iii. බුදුගුණ අලංකාරයේ ය
iv. ගුත්තිල කාව්‍යයේ ය

17) ලෝකපාලන ධර්මතා වන්නේ,

i. ලැජ්ජාව - තණ්හාව
ii. තණ්හාව - භය
iii. හිරි - ඔත්තප්ප
iv. තණ්හාව - ඔත්තප්ප

18) බුදුරුව දැක සිත පහදවා ගැනීමෙන් දෙව්ලොව උපන්නේ,

i. මට්ටකුණ්ඩලී ය
ii. සුභ මානවකයා ය
iii. මඝ මානවකයා ය
iv. සුනීත ය

19) අවමඟුල් නිවෙස්වල රාත්‍රි කාලයේ සජ්ඣායනය කරනු ලබන සූත්‍ර දේශනාවන් වනුයේ,

i. ජය පිරිත
ii. සතිපට්ඨාන සූත්‍රය
iii. මහා මංගල සූත්‍රය
iv. කරණීය මෙත්ත සූත්‍රය

20) ධම්ම පදයේ ඇතුළත් ගාථා ගණන වන්නේ,

i. 423
ii. 426
iii. 26
iv. 24

## II කොටස

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක්ද අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු 10 බැගින් ද හිමිවේ.

1) ඔබ පන්තියේ බුද්ධ ධර්ම විෂයට අදාළව දෙවන වාරයේ සිදුකළ භූමිකා රංගනය ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. එම ඇගයීම සඳහා නියමිත පාඩමේ මාතෘකාව ලියන්න.
2. ඇගයීම සිදු කිරීමට පෙර ගුරුතුමා විසින් ඔබට ලබාදුන් උපදෙස් 2ක් ලියන්න.
3. භූමිකා රංගනය සඳහා යොදාගත් චරිත 2ක් ලියන්න.
4. එහිදී ඔබට ලැබුණු චරිතය කුමක් ද?
5. භූමිකා රංගනය තුළදී ඔබට ඇතිවූ ගැටළු 2ක් ලියන්න.
6. භූමිකා රංගනය තුළදී ඔබ ලැබූ අත්දැකීම් 2ක් ලියන්න.
7. පන්සිය පනස් ජාතක පොත් වහන්සේ රචනා වුණේ කිනම් යුගයකදී ද?
8. අප බෝසතානන් වහන්සේගේ ප්‍රඥා මහිමය පෙන්වාදෙන ජාතක කතාව කුමක් ද?
9. මහෞෂධ පණ්ඩිතයන් විසින් විසඳූ ප්‍රශ්න අතරින් 2ක් ලියන්න.
10. වේදේහ රජතුමාට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කළ පඬිවරු අතරින් දෙදෙනෙකු නම් කරන්න.

2)

1. සීලය යනු කුමක් ද?
2. පංචශීලයට අයත් නොවන දස ශීලයට අයත් ශික්ෂා පද අතරින් 03 ක් ලියන්න.
3. "මත්ද්‍රව්‍ය භාවිතය පුද්ගල ජීවිතයට හානිකර වේ" එවැනි හානිකර වන කරුණු 5ක් ලියන්න

3)

1. එකිනෙකාට අන්‍යෝන්‍ය වශයෙන් යුතුකම් ඉටුකළ යුතු බව කියැවෙන සූත්‍ර දේශනාව කුමක් ද?
2. එම සූත්‍රයට අනුව සැමියාගෙන් බිරිඳට ඉටුවිය යුතු යුතුකම් අතරින් 3ක් ලියන්න.
3. යහපත් මිතුරෙකු වීම සඳහා ඔබ තුළ ගොඩනගා ගත යුතු ගුණධර්ම මොනවාදැයි පැහැදිලි කරන්න.

4)

1. බුදු රජාණන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනය කුමක් ද?
2. තණ්හාවේ ප්‍රභේද තුන නම් කරන්න.
3. තණ්හාවට වහල් වීමෙන් මිනිසුන් විවිධ ප්‍රශ්න හා විපත් වලට මුහුණ දුන් අවස්ථා 5ක් ලියා දක්වන්න.

5)

1. බුදු දහමේ කර්ම නමින් හැඳින්වෙන්නේ කුමක් ද?
2. බුදු දහමට අනුව කර්ම සිදුවන දොරටු තුනකි, ඒවා නම් කරන්න.
3. දස අකුසල ලියා ඒවා තුන්දොරට බෙදා දක්වන්න.

6)

1. භික්ෂූන් වහන්සේලාගේ ප්‍රසාද ජනන පැවැත්ම උදෙසා බුදුරජාණන් වහන්සේ විසින් පනවන ලද ශික්ෂාපද හඳුන්වන නම කුමක් ද?
2. ඇඳුම් ඇඳීමේ පරමාර්ථ තුනක් ලියන්න.
3. ආහාර ගැනීමේදී  සිසුන් ලෙස ඔබ අනුගමනය කළයුතු කරුණු 5ක් ලියන්න.